## ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

# ශිල්ප කලා

## 11 ශ්‍රේණිය – 2019 – I වාර පරීක්ෂණය

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් එක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් වඩාත් ගැළපෙන පිළිතුර සපයන්න.**

01) අතීත ලංකාවේ ප්‍රභූ කාන්තාවන් අතර වඩාත් ප්‍රචලිතව පැවැති ජන කලාවක් ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) පන් කර්මාන්තය (2) ලාක්ෂා කර්මාන්තය (3) මැටි කර්මාන්තය (4) බීරලු කර්මාන්තය

02) අතීතයේ "ලෝකුරුවන්" ලෙස හැඳින්වූයේ කුමන කර්මාන්තයක් හා බැඳුණු කාර්මිකයන්ද?

(1)ස්වර්ණාභරණ කර්මාන්තය (2) වෙස්මුහුණු කර්මාන්තය

(3)ලාක්ෂා කර්මාන්තය (4) පිත්තල කර්මාන්තය

03) කාර්මික ඇඳීමේදී භාවිතා කරන කඩදාසි ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව සකස් වී ඇත. මෙම සකස් කිරීමට අනුව $A^3$ කඩදාසියක සම්මත ප්‍රමාණය කුමක්ද?

(1) 297mm X 420mm (2) 420mm X 594mm

(3) 841mm X 1189mm (4) 210mm X 297mm

04) කාර්මික ඇඳීමේදී සැඟි දාර දැක්වීම සඳහා භාවිතා කරනු ලබන රේඛා වර්ගය කුමක්ද?

(1) ඝන අඛණ්ඩ රේඛාය (2) කඩ රේඛාය

(3) සිහින් අකණ්ඩ රේඛාය (4) සිහින් දාම රේඛාය

05) අප අවට පරිසරයේ බොහෝ මල් වෘත්තාකාර හැඩයක් ගෙන ඇති බව ඔබ දැක ඇත. වෘත්ත නිර්මාණය පිළිබඳ කුසලතා ලබාගත් ඔබ එම නිර්මාණයේදී වෘත්ත කොටස්වලට බෙදීමේ ක්‍රම ශිල්ප ගණන කීයද?

(1) 2 කි (2) 4 කි (3) 1 කි (4) 3 කි

06) රූපයේ දක්වා ඇති පරිදි ABC කෝණය ජ්‍යාමිතික නිර්මාණ මගින් සමච්ඡේදනය කිරීමට භාවිතා කල යුතු උපකරණය වන්නේ,




(1) කෝදුව හා කෝණමානය (2) කෝදුව හා බෙදුම් කටුව

(3) කෝදුව හා විහිත චතුරස්‍රය (4) කෝදුව හා කවකටුව

07) දරුවන් සඳහා සැකසෙන සැහැල්ලු සෙල්ලම් බඩු අතර එකක් වන බෝලය මැසීමට ඔබ උපයෝගී කරගනු ලබන ජ්‍යාමිතික හැඩතලය මින් කුමක්ද?



(1) (2) (3) (4)

08) කුඩා දරුවෝ වඩාත් ප්‍රිය කරන බෝනික්කන් විවිධාකාර අමුද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණය කර අද වෙළඳපොළේ දක්නට ලැබේ. සිලින්ඩරාකාර හැඩයට බෝනික්කෙකු නිර්මාණය කිරීමේදී සිලින්ඩරයක විකසනය යොදාගත යුතුය. සිලින්ඩරයේ විකසනය වන්නේ?

(1) සමචතුරස්‍රයකි (2) ඍජුකෝණාස්‍රයකි (3) රොම්බසයකි (4) ත්‍රිකෝණයකි

09) රූපයේ දැක්වෙන්නේ කෝණ 4 නිර්මාණය වී ඇති ආකාරයයි. මෙහි 1,2,3,4 ලෙස අංක කර ඇති කෝණ අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) ඍජු කෝණය / සුළු කෝණය / සරල කෝණය / මහා කෝණය
(2) සුළු කෝණය / ඍජුකෝණය / මහා කෝණය / සරල කෝණය
(3) සුළු කෝණය / මහා කෝණය / ඍජු කෝණය / සරල කෝණය
(4) සරල කෝණය / මහා කෝණය / සුළු කෝණය / ඍජු කෝණය




10) රූපයේ දැක්වෙන්නේ වෘත්තයක් සමාන කොටස් හතරකට බෙදා ඇති ආකාරයකි. 1,2,3,4 මගින් දැක්වෙන වෘත්ත කොටස් හඳුන්වන්නේ,

(1) කුඩා වෘත්ත ඛණ්ඩ ලෙසය (2) මහා වෘත්ත ඛණ්ඩ ලෙසය
(3) වෘත්ත ජ්‍යායක් ලෙසය (4) වෘත්ත පාද ලෙසය

11) පිළි අලංකරණයේ දී සායම් පෙවීම, ආලේපණය, මුද්‍රණය වැනි ක්‍රමවේද භාවිතා කෙරේ. මේ අතුරෙන් සායම් පෙවීම යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) තෝරාගත් ප්‍රදේශයක බාහිර උප කරණයක් මගින් සායම් ගැල්වීමයි.
(2) පෙහෙකම් ද්‍රව්‍ය පුරාම වර්ණ පැතකිර යාමට සැලැස්වීමයි.
(3) පින්සලක ආධාරයෙන් රෙද්ද මත සායම් ගැල්වීමයි.
(4) බාහිර උපකරණයක ආධාරයෙන් රෙද්ද මත සායම් මුද්‍ර තැබීමයි.

12) සායම්කරණයේ දී මූලික වර්ණ 2 ක් සම්මිශ්‍රණයේ දී ලැබෙන වර්ණය කුමන වර්ණ ගණයට අයත් වේ ද?
(1) තෘතික වර්ණ (2) ද්විතීක වර්ණ (3) ප්‍රාථමික වර්ණ (4) චතුර් වර්ණ

13) මූලික වර්ණ අනුසාරයෙන් වර්ණ සකස් කරගනිමින් රෙදි පින්තාරු කරනු ලැබේ. මූලික වර්ණ ලෙස සැලකෙන්නේ,
(1) කළු, සුදු සහ නිල් (2) රතු, සුදු සහ කළු
(3) නිල්, කහ සහ රතු (4) රෝස, සුදු සහ නිල්

14) පින්සල් හඳුනාගැනීම සඳහා අංකනය කර ඇත. එසේ අංකනය කිරීමට පදනම වන්නේ,
(1) පින්සල් සකස් කර ඇති හැඩයයි. (2) පින්සලෙන් කෙරෙන කාර්යයි.
(3) යොදා ඇති කෙඳි වර්ගයයි. (4) යොදන ලද කෙඳි ප්‍රමාණයයි.

15) පිළි අලංකරණයේ දී භාවිතයට ගනුලබන නිෂ්පාදිත රෙදිවල ස්වභාවික හා බාහිරව එක් වූ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.
A. කැඳහරණය B. මලහරණය C. විරංජනය D. වාෂ්පිකරණය
මේ අතුරෙන් පෙර පිරියම්කරණයට අදාළ මූලික අවස්ථාව වන්නේ,
(1) ABC (2) ABD (3) ACD (4) BCD

16) සරල පින්තාරු ක්‍රමයක් වන නූල් මඟින් මුද්‍රා තැබීමේ ක්‍රමය පහත දැක්වේ.
A- රෙදි මුද්‍රණ සායම් බඳුනකට දමා ගැනීම
B- නූල් කොටස් ඇඟිලි තුඩු ආධාරයෙන් සායන බඳුනේ විසුරුවා හැරීම
C- කපුරෙදි කැබැල්ලක් මුද්‍රණ තලයේ රැලි නොවැටෙන සේ අතුරා ඩ්‍රොවින් ඇණ ගැසීම
D- වර්ණ සහිත නූල් මුද්‍රණ තලයේ රටා ලැබෙන සේ යෙදීම
E- මඳ පවනේ වියළෙන්නට තැබීම
ඉහත පියවර අනුපිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,
(1) ABCDE (2) BADCE (3) CABDE (4) CBADE

17) අච්චු මුද්‍රණ ක්‍රමයේ දී ශාකමය කොටසක හරස්කඩ කැපුමක් ලෙස භාවිතා කර ඇති ආකාරය රූපයේ දැක්වේ. එම මෝස්තරය සඳහා යොදාගෙන ඇත්තේ,
(1) කෙසෙල් පිත්තක කොටසකි (2) අර්තාපල් අලයක කොටසකි
(3) බණ්ඩක්කා කරලක කොටසකි (4) හබරල පිත්තක කොටසකි

18) රෙදි නිෂ්පාදනය සඳහා පහත සඳහන් කෙඳි භාවිතා කරයි. ඒ අතරින් ඛනිජමය කෙඳි වර්ගයකි,
(1) නියඳ (2) රැමි (3) ඇස්බැස්ටස් (4) සිසල්

19) ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කීපයක වැවෙන පැළෑටියකි. මෙය ගෝනි හණ වෙන්කර ගැනීමට යොදාගනියි. එම ශාක වර්ගය වන්නේ,
(1) ජුට් (2) මැනිලා (3) හණ (4) පෙනා

20) සත්ත්ව කෙඳි ලබා ගැනීම සඳහා විවිධ සතුන් උපයෝගී කරගනියි. උසස් වර්ගයේ කෙඳි ලබා ගනී. බැටලු වර්ගය වන්නේ,
(1) මස් බැටළුවා (2) දික් ලොම් බැටළුවා
(3) දෙමුහුම් බැටළුවා (4) මැරිනෝ බැටළුවා

21) කෙඳි පරීක්ෂාවේ දී පිලිස්සුම් පරීක්ෂාව සිදුකරයි. ඉතා කුඩා අළු ගුලි සැදෙන, පිහාටු පිළිස්සෙන ගඳ වහනය වන කෙඳි වර්ගය වන්නේ,
(1) කපු (2) ලිනන් (3) ලෝම (4) කෘතිම සේද

22) රෙදි නිෂ්පාදනය සඳහා කෙඳි වර්ණ ගැන්වීමේදී අම්ල (acid) සායම් භාවිතයෙන් වර්ණ ගැන්විය යුතු වන්නේ,
(1) කපු හා ලිනන් වැනි සෙලියුටලෝසික කෙඳි (2) රන්, රිදී, වීදුරු වැනි ඛනිජ කෙඳි

(3) ලෝම, සේද හා නයිලෝන් වැනි පොලිඇමයිඩ් කෙඳි  (4) කේසින්, විකාරා, කැස්ලන් වැනි සංශ්ලේෂිත කෙඳි

23) පහත දැක්වෙන්නේ වාම් වියමන් පවුලේ ප්‍රභේද 04 ය. දී ඇති වියමන් රටා පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,



a b c d

(1) ජටා /දික්දාර / වාම් /හරස්දාර    (2) වාම් / දික්දාරා / හරස්දාර / ජටා

(3) හරස්දාර / ජටා / දික්දාර / වාම්    (4) වාම් / ජටා / දික්දාරා / හරස්දාර

24) මාතෘ පාෂාණය ජීර්ණය වීමෙන් මැටි නිර්මාණය වේ. එම මැටි අතුරෙන් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දායක කරගනු ලබන්නේ,

(1) 0.002 mm ට වඩා කුඩා කලිලමය මැටි අංශුය    (2) 1.02 mm ට වඩා කුඩා කලිලමය මැටි අංශුය

(3) 2.02 mm ට වඩා කුඩා කලිලමය මැටි අංශුය    (4) 2.22 mm ට වඩා කුඩා කලිලමය මැටි අංශුය

25) රෙදි නිෂ්පාදනයේ දී යොදා ගන්නා සියලුම වියමන් රටා මූලික වියමන් ක්‍රම තුනකට ප්‍රභේද ඇතුළත් රටා කාණ්ඩය තෝරන්න.

(1) ජටා / දාර / හීරි    (2) වාම් / හීරි / සැටින්    (3) හීරි/ වාම් / දාරා    (4) සැටින් / වාම් / දාර

26) කෙඳි හඳුනා ගැනීමේ සරල පරීක්ෂාවේ දී කෙන්දක තිරස් පෙනුම හා සිරස් පෙනුම පිලිබඳ අවබෝධය ලබාගත හැකි වන්නේ කුමන පරීක්ෂණයේ දීද?

(1) ස්පර්ශ කිරීමේ පරීක්ෂාව    (2) අන්වීක්ෂීය පරීක්ෂාව

(3) පැල්ලම් පරීක්ෂාව    (4) කෙඳි කඩා බැලීමේ පරීක්ෂාව

27) මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඇලෙනසුලු අමුද්‍රව්‍යයක් වන්නේ,

(1) රතු මැටි    (2) සිලිකා වැලි    (3) ක්වාට්ස්    (4) ඩොලමයිට්

28) රිබන් එම්බ්‍රොයිඩර් කිරීමේ දී විවිධ මැහුම් ක්‍රම භාවිතා කරයි. ඒ සඳහා භාවිතා කරන පහත රූපයේ දක්වා ඇති මැහුම් ක්‍රමය කුමක්ද?

(1) ප්‍රංශ ගැටය    (2) ලූප් මැස්ම

(3) ලේසිඩේසි මැස්ම    (4) නැටි මස්ම

29) භාණ්ඩ නිෂ්පාදනයේ දී විවිධ මැටි වර්ග යොදා ගනියි. ප්‍රාථමික මැටි භාවිතයෙන් කෙරෙන නිෂ්පාදනය වන්නේ,

(1) උළු හා වළං    (2) ගඩොල් හා රතු මැටි භාණ්ඩ

(3) තීන්ත හා සෙරමික් භාණ්ඩ    (4) වළං හා පෝරණු උපාංග

30) යකඩ ප්‍රතිශතය ඉතා සුළු වශයෙන් අඩංගු වී ඇති පිළිස්සු පසුද සුදු වර්ණයෙන් දිස්වන මැටි වර්ගය වනුයේ,

(1) කෙඔලින් මැටි    (2) මයිකාමය මැටි    (3) බෝල මැටි    (4) මොන්ටොමොරලොනයිට් මැටි

31) ප්‍රමිතිගත භාණ්ඩයක් නිර්මාණය කරගැනීම සඳහා මැටිවල තිබිය යුතු භෞතික හා රසායනික ගුණ වන්නේ,

(1) සුවිකාර්යතාව / සච්ඡරතාව / වයනය / හැකිළීම

(2) ඝනත්වය / භංගුරතාව / සක්‍යතාව / වර්ණයයි

(3) තත්‍යතාව / නම්‍යතාව / භංගුරතාව / වයනය

(4) ශක්‍යතාව / අනම්‍යතා / ඝනත්වය / වර්ණය

32) පිළි අලංකරණ ක්‍රමයක් ලෙස රෙදි කොටසක් විවිධ ක්‍රමවලට ගැට ගැසීම මගින් බාධක යොදා සායම් පෙවීම සිදු කරයි. මෙම ක්‍රමය හඳුන්වනු ලබන්නේ,

(1) ආලෝක සංවේදී ක්‍රමය ලෙසය    (2) වැටි ඩයි යෙදීමේ ක්‍රියාවලිය ලෙසය

(3) ගැටපඩු යෙදීමේ ක්‍රියාවලිය ලෙසය    (4) බතික් මෝස්තර යෙදීමේ ක්‍රියාවලිය ලෙසය

33) ඇලුමිනා සිලිකේට් ලෙස රසායනිකව හඳුන්වන භාණ්ඩ නිෂ්පාදනයට භාවිතා කරන මැටිවල අන්තර්ගත සංයෝග වන්නේ,

(1) ඇලුමිනියම් ඔක්සයිඩ්, ටයිටේනියම් හා ජලයයි

(2) සිලිකන් ඔක්සයිඩ්, ඇලුමිනියම් ඩයොක්සයිඩ් හා ජලයයි

(3) ඇලුමිනියම් ඔක්සයිඩ්, සිලිකන් ඩයොක්සයිඩ් හා ජලයයි

(4) සිලිකන් ඩයොක්සයිඩ්, මැග්නීසියම් හා ජලයයි

34) පහත දක්වා ඇති A,B,C,D එක් එක් මැටි භාණ්ඩය නිපදවා ගැනීමට භාවිතා කර ඇති නිෂ්පාදන ක්‍රමය අනුපිළිවෙලින් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.




(1) අච්චු ක්‍රමය / සකපෝරුවේ ඉදිකිරීම් / දරණු ක්‍රමය / තහඩු ක්‍රමය
(2) සකපෝරුවේ ඉදිකිරීම් / අච්චු ක්‍රමය / තහඩු ක්‍රමය / දරණු ක්‍රමය
(3) තහඩු ක්‍රමය / දරණු ක්‍රමය / අච්චු ක්‍රමය / සකපෝරුවේ ඉදිකිරීම
(4) දරණු ක්‍රමය / තහඩු ක්‍රමය / අච්චු ක්‍රමය / සකපෝරුවේ ඉදිකිරීම්

35) මෙම ජ්‍යාමිතික නිර්මාණයේ දැක්වෙන ඉලිපිස්සියේ AB රේඛාව හැඳින්වෙන්නේ,




(1) මහා අක්ෂය නමිනි
(2) සුළු අක්ෂය නමිනි
(3) පථය නමිනි
(4) නාභිය නමිනි

36) තනිකටුව භාවිතයෙන් තොප්පිය ගෙතීමේ දී ආරම්භක පියවර හෙවත් මුලික පියවර කුමක්ද?

(1) දම්වැල් ගෙතීම
(2) දෙපට පිරවිල්ල යෙදීම
(3) තනිපට පිරවිල්ල යෙදීම
(4) පත්තෑයා පටිය ගෙතීම

37) රූපයේ දැක්වෙන්නේ වෘත්තයක සමපාද ත්‍රිකෝණ හැඩය ලැබෙන සේ නැවුම් දාර යොදා නමා සේයා කර ඇති ආකාරයයි. එම සේයාකාර ඇති කොටස් හඳුන්වනු ලබන්නේ,



(1) වෘත්ත චාප නමිනි
(2) වෘත්ත ජ්‍යයන් නමිනි
(3) වෘත්ත ඛණ්ඩ නමිනි
(4) වෘත්ත පාද නමිනි

38) උද්‍යාන අලංකරණයේ දී අව්, වැසි, සුළං ආදියට වඩාත් හොඳින් ඔරොත්තු දෙන නිෂ්පාදන මාධ්‍යය,

(1) සිමෙන්ති (2) ලී (3) ප්ලාස්ටික් ඔෆ් පැරිස් (4) පල්ප

39) රෙදිපිළි අලංකරණයට යොදනු ලබන මෙම රූපයේ සඳහන් මැස්ම හඳුන්වන නම වන්නේ,



(1) දම්වැල් මැස්ම
(2) ලේසිඩේසි මැස්ම
(3) හුරුළු කටු මැස්ම
(4) බ්ලැන්කට් මැස්ම

40) පිටතින් ලබා ගන්නා රෙදි කොටසක් තමාට අවශ්‍ය නිර්මාණයක ඕනෑම ස්ථානයකට මැසීමෙන් තොරව බද්ධ කිරීමේ ක්‍රමය භාවිතා කරන්නේ,

(1) නෙට්වර්ක් අලංකරණ ක්‍රමයේ දී ය
(2) පැච්වර්ක් අලංකරණ ක්‍රමයේ දී ය
(3) තාප බන්ධිත අලංකරණ ක්‍රමයේ දී ය
(4) බතික් මුද්‍රණ අලංකරණ ක්‍රමයේ දී ය

## II කොටස

- **පළමුවන ප්‍රශ්ණය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. ශ්‍රී ලාංකීය සංස්කෘතික උරුමය ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා සිසු දරුවන් විසින් විවිධ ප්‍රදර්ශන පැවැත්වීමට කටයුතු යොදාගෙන ඇත. ශ්‍රී ජයවර්ධනපුර කලාපයේ ශිල්ප කලා හදාරන සිසුන්ගේ ප්‍රදර්ශනය පසුගිය දා පැවැත්විණි. 2019 වර්ෂය ප්‍රදර්ශනය සඳහා සුදානම් වෙමින් පවතී.
    (1) මෙම ප්‍රදර්ශනය පිළිබඳ පණිවිඩය ජනතාවට දැන්වීම සඳහා පෝස්ටරයක් නිර්මාණය කරන්න.
    (2) ආරාධිතයින් සඳහා යවන ආරාධනා පත්‍රයේ ආකෘතියක් නිර්මාණය කරන්න.
    (3) ප්‍රදර්ශනයට පැමිණෙන නිර්මාණ ශිල්පීන් හඳුනා ගැනීමට අවශ්‍ය නිල ලාංඡනයක් පිළියෙල කරන්න.
    (4) ප්‍රදර්ශනයේ අලෙවිය සඳහා අවශ්‍ය ගෘහ අභ්‍යන්තර අලංකරණ හතරක් නම් කරන්න.
    (5) පිළිගැනීමේ නැටුම් කණ්ඩායමේ ඇඳුම් අලංකාර කිරීමට සුදුසු අලංකරණ ක්‍රම 4 ක් නම් කරන්න.
    (6) ඉදිරිපස දොරටුව අලංකාර කිරීම සඳහා ගොක්කොළ භාවිතා කර චාම් වියමන් රටාවෙන් තොරණක් සකස් කර තිබුණි. චාම් වියමනේ ප්‍රභේද නම් කරන්න.
    (7) ආරාධිතයින්ට සකස් කළ රස කැවිලි ඇසිරීම සඳහා සුදුසු පෙට්ටියක විකසනය අඳින්න.
    (8) මැටි භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා යොදාගත් ක්‍රම 2 ක් නම් කරන්න.
    (9) ජයග්‍රාහකයින්ට පිරිනැමීමට සුදුසු ජය සංකේතයක ආකෘතියක් ඇඳ දක්වන්න.
    (10)ත්‍යාග පිරිනැමීමට පේපර් ක්විලින් භාවිතයෙන් අලංකාර කළ අසුරන භාවිතා කොට තිබුනි. ඒ සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න.
02. විවිධ මල් සැකසුම් ක්‍රියාවලි සඳහා ජ්‍යාමිතික හැඩතල භාවිතයට ගනී. වෘත්තාකාර හැඩතල ඒ අතර වැදගත් වේ.
    i) අරය සෙ.මී.5 ක් ඇති වෘත්තයක් ඇඳ එහි විශ්කම්භය, කේන්ද්‍රික ඛණ්ඩය, වෘත්ත ඛණ්ඩය, වෘත්ත පාදය, ජ්‍යාය, කේන්ද්‍රය ලකුණු කරන්න.
    ii) ඩේලියා මල සැකසීමට අවශ්‍ය වෘත්ත තුන මිමි සහිතව අඳින්න.
    iii) ඩේලියා මල නිර්මාණය කරන ආකාරය පියවරෙන් පියවර ලියන්න.
03. පිළි අලංකරණයට පෙර වර්ණ තහවුරු කිරීම සඳහා පෙර පිරියම් කිරීම අත්‍යාවශ්‍යය.
    i) පෙර පිරියම් ක්‍රම නම් කරන්න.
    ii) කැඳහරණය සිදුකරන ක්‍රියාවලි තුන ලියන්න.
    iii) ලෝම රෙදි සඳහා සිදු කරන පෙර පිරියම් ක්‍රමය නම්කොට ලෝම විරංජන රසායනික ක්‍රියාවලිය ලියන්න.
04. ආහාර මෙන්ම වස්ත්‍ර ද මිනිසාට අත්‍යවශ්‍ය ය. විවිධ කෙඳි උපයෝගී කරගෙන අතීතයේ මිනිසා රෙදි නිෂ්පාදනය කර ඇත.
    i) රෙදි නිෂ්පාදනය සඳහා කෙඳි ලබාගන්නා ක්‍රම 2 ක් නම් කරන්න.
    ii) උසස් වර්ගයේ ලෝම කෙඳි ලබා ගන්නා සතුන් 3 ක් නම් කරන්න.
    iii) කෙඳි හඳුනාගැනීමේ පරීක්ෂණ 3 ක් ලියා ඒවා හඳුනා ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. අතීතයේ මිනිසා මූලික අවශ්‍යතාවයන් සපුරාගැනීමට තැනින් තැන සැරිසරද්දී ජලශ්‍රිත ප්‍රදේශවලින් මැටි සොයා ගන්නා ලදී.

i) මැටි හඳුන්වන රසායනික නාමය හා මැටි වල සංයුතිය දක්වන්න.

ii) මටිවල පවතින භෞතික ලක්ෂණ 3 ක් ලියා එකක් කෙටියෙන් හඳුන්වන්න.

iii) පදම් මැටි භාවිතා කොට මැටි දරණු ආශ්‍රිත නිර්මාණයක් කරන ආකාරය රූප සටහන් ද සමගින් ලියන්න.

06. රෙදි කැබලි එකිනෙක සම්බන්ධ කිරීමට සහ අලංකාර කිරීමට යොදන මැහුම් ක්‍රම කිහිපයකි.

i) විසිතුරු මැහුම් ක්‍රම 4 ක් ලියන්න.

ii) පැච්වර්ක් නිර්මාණයක් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 5 ක් ලියන්න.

iii) පැච්වර්ක් නිර්මාණයකට සුදුසු මෝස්තරයක් අඳින්න.

07. මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ටාචාර සහ බැබිලෝනියානු ශිෂ්ටාචාර ආදියෙහි දී මනරම් උද්‍යාන තිබූ බවට තොරතුරු හෙලි වී ඇත.

i) උද්‍යාන අලංකරණ කෘති නිර්මාණය කරන ක්‍රම කීයද? නම් කරන්න.

ii) මූර්ති ගොඩනැගීමේ දී යොදා ගන්නා ශිල්ප ක්‍රම නම් කරන්න.

iii) උද්‍යාන අලංකරණ නිර්මාණය කිරීමේ දී ශිල්පියකු විසින් අවධානය යොමු කළ යුතු උද්‍යාන මූලධර්ම 2 ක් ලියන්න.

iv) උද්‍යාන අලංකරණ නිර්මාණයක රූප සටහනක් ඇඳ දක්වන්න.